# අත්තම්මා



චතුලි සචිත්‍යා බණ්ඩාර වීරසුන්දර

# අත්තම්මා

**2023**

**කතෘ ප්‍රකාශනයකි.**

**ISBN 978-624-206-793-3**

**කථාව සහ චිත්‍ර -**

**චතුලි සචිත්‍යා බණ්ඩාර වීරසුන්දර**

**2 ශ්‍රේණිය E**

**මහාමායා බාලිකා විදුහල**

**2023.11.15**

# පිදුම

මා රැකගත්

අත්තම්මාට, ලොකු අත්තාට

සහ

අකුරු ලියවූ ගුරුතුමියට

ආදරයෙනි……

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලද දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර
විදුහල් පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 10 20



දවසක් මමයි අත්තම්මයි කුඹුරට ගියා ගොයම් කපනවා බලන්න. මගේ ලොකු අත්තා තමයි කුඹුරේ වැඩ කරන්නේ. තවත් ගමේ නැන්දලා මාමාලා ගොඩක් ඇවිත් හිටියා ලොකු අත්තට උදව් කරන්න.



මම පුංචි කාලේ ඉඳන් ලොකු අත්තට ආදරේට කතා කරන්නේ 'ලොකූ' කියලා. ලොකූට හරිම සතුටුයි මාව දැකලා. දුවගෙන ඇවිත් මාව වඩාගෙන මාගේ මූණ ඉම්බා.



ඊට පස්සේ මමත් කුඹුරට බැස්සා. ගොයම් කපන්න උදව් උනා. පුංචි පුංචි ගොයම් මිටි එකතු කලා. ඒවා නැන්දලාට ගිහින් දුන්නා.



අව්ව පායලා. කුඹුරු යායම හරිම ලස්සනයි. සුළං හමනවා. කහ පාට ගොයම් කරල් එහෙ මෙහෙ වැනෙනවා. ඇතින් වසු පැටියෙකුත් උම්බෑ කියලා කෑ ගහනවා බඩගිනි වෙලා. කුඹුර ළඟින් ලස්සන පොඩි ඇළක් ගලාගෙන යනවා. එදා නම් වතුර ටිකයි තිබුනේ.



මම අත්තම්මාගේ අතින් අල්ලගෙන ඇළට බැස්සා. චුටි චුටි මාළුවෝ ගොඩායි. එහෙට මෙහෙට පීනනවා. බලාගෙන ඉන්නත් ආසයි. මගේ කකුල් දෙකත් හපනවා. මට කිති කැවෙනවා. මම උඩ පැන පැන වතුරේ සෙල්ලම් කලා. මාළුවෝ අල්ලන්න බැලුවත් මට බැරි උනා. පුංචි උනත් එයාලා හරිම දක්ෂයි. මම ළඟට යද්දි ඈතට පීනනවා. මගේ සෙල්ලම් දැකලා අත්තම්මටත් හරිම හිනා.



අව්වත් හරි සැරයි. බඩගිනියි. ඔන්න ලොකු අම්මා කුඹුරේ වැඩ කරන අයට තේ ගෙනාවා. මමත් ඒ නැන්දලා මාමාලා එක්කම රොටියි ලුණු මිරිසුයි කාලා තේ බිව්වා. කට දනවා. ඒත් හරිම රසයි. ඒ රස මට තාමත් මතකයි.



ඒ වගේ රස මතක ගොඩාක් මට දුන්නේ මගේ ආදර අත්තම්මා. අම්මා මාව අත්තම්මා ළඟ දාලා ඈත රස්සාවට යද්දි මට වයස අවුරුද්දයිලු. මම අඬද්දි කවි කතන්දර කියලා මාව නලවලා ආදරෙන් බලාගත්තේ අත්තම්මා තමයි කියලා අම්මා මට කියනවා.



අත්තම්මයි ලොකුයි එයාලා යන යන හැම තැනම මාවත් අරගෙන ගියාලු. කඩේට, පොළට, අත්තම්මාගේ ක්ලිනික් එකට, ඉස්පිරිතාලෙට, මළගෙවල්, මඟුල් ගෙවල්, දානේ ගෙවල් හැම තැනටම.



අත්තම්මට වඳිනකොට ගොඩාක් පිං දෙනවා. පිං දීලා ඉවර වෙනකම් මම වැඳගෙන ඉන්නවා. කකුල් දෙකත් රිදෙනවා. ඒ උනාට අත්තම්මා ඔලුව අත ගගා පිං දෙනවා අහන්න මම ආසයි. ගොඩක්ම ආසයි අත්තම්මා අන්තිමට කියන "මගෙ වස්තුව හොඳට ඉගෙනගෙන තරුවක් මැණිකක් පහනක් වගේ බබලන්ට ඕන" කියනවා අහන්න.



අද අත්තම්මා  මගේ ළඟ නෑ. අත්තම්මාගේ සුවඳ මතකවලට මම හරිම ආසයි. අම්මා කියනවා අත්තම්මා දිව්‍ය ලෝකේ ගියාලු. මම ලෝකයම දිනන පුංචි තරුවක් වෙනකම් මගේ අත්තම්මා මගේ දිහා බලාගෙන ඇති............. අත්තම්මාගේ ප්‍රාර්ථනාව මම ඉෂ්ට කරනවා. ගොඩාක් ආදරෙයි මගේ අත්තම්මේ.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

**මෙයට,**

**සෙනෙවිරත්න මහලේකම්**

**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ**

**2023. 10. 20**

**ISBN 978-624-206-793-3**